# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1813/1 – 2013 ජුනි 03 වැනි සඳුදා – 2013.06.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම් පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, ඒවා ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, පිටබැද්දර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මොරවක් කෝරළයේ සුළු කොට්ඨාසයේ පිටබැද්දර ගමේ පිහිටි මාතර කොට්ඨාස භාර සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක MR/PTB/2012/85 හා 2012.05.31 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සඳහන් කැබලි අක්ෂර ඒ සිට ඊ වශයෙන් පෙන්නුම් කරන දංකොළුව වත්ත තැන්නහේන කොටස නැමති ප්‍රමාණයෙන් හෙක්. 7.9749 ක් පමණ වූ ඉඩම් කොටස්වලට මායිම්:

01. කැබලි අක්ෂර 'ඒ' – දංකොළුවවත්ත, තැන්නහේන කොටස – **ප්‍රමාණය: හෙක්. 1.4797**

උතුරට, නැගෙනහිරට, දකුණට සහ බටහිරට: ඉඩම් ප්‍රතිසංස්කරන කොමිෂන් සභාව හිමිකම් කියන දංකොළුව වත්ත තැන්නහේන කොටස.

02. කැබලි අක්ෂර 'බී' – දංකොළුවවත්ත, තැන්නහේන කොටස – **ප්‍රමාණය: හෙක්. 0.9127**

උතුරට: මාර්ගය සහ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන දංකොළුවවත්ත තැන්නහේන කොටස; නැගෙනහිරට: ජී. සංජීව කුමාර සහ තවත් අය හිමිකම් කියන මල්පුදනැල්ල දෙනිය; දකුණට: ජී. සංජීව කුමාර සහ තවත් අය හිමිකම් කියන මල්පුදනැල්ල දෙනිය සහ මාර්ගය; බටහිරට: මාර්ගය.

03. කැබලි අක්ෂර 'සී' – දංකොළුවවත්ත, තැන්නහේන කොටස – **ප්‍රමාණය: හෙක්. 3.2237**

උතුරට: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන දංකොළුවවත්ත තැන්නහේන කොටස සහ මාර්ගය; නැගෙනහිරට: මාර්ගය; දකුණට: මාර්ග (මා.සං.අ.) සහ නාගොඩ විතානගේ හේමලතා හිමිකම් කියන දංකොළුවවත්ත තැන්නහේන කොටස; බටහිරට: මාර්ගය, ජී. සංජීව කුමාර සහ තවත් අය හිමිකම් කියන මල්පුදනැල්ල දෙනිය සහ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන දංකොළුවවත්ත තැන්නහේන කොටස.

04. කැබලි අක්ෂර 'ඩී' – දංකොළුවවත්ත, තැන්නහේන කොටස – **ප්‍රමාණය: හෙක්. 2.3104**

උතුරට: මාර්ගය, තම්බිපිල්ලවත්තේ වෙන්දේසි ඉඩම සහ ටී. ජී. සුමතිපාල හිමිකම් කියන දංකොළුවවත්ත තැන්නහේන කොටස සහ මාර්ගය; නැගෙනහිරට: තම්බිපිල්ලවත්තේ වෙන්දේසි ඉඩම සහ ටී. ජී. සුමතිපාල හිමිකම් කියන දංකොළුවවත්ත තැන්නහේන කොටස සහ මාර්ගය; දකුණට: මාර්ගය සහ මාර්ග (මා.සං.අ.); බටහිරට: මාර්ගය.

05. කැබලි අක්ෂර 'ඊ' – දංකොළුවවත්ත, තැන්නහේන කොටස – **ප්‍රමාණය: හෙක්. 0.0484**

උතුරට: මාර්ගය; නැගෙනහිරට සහ දකුණට: තම්බිපිල්ල වත්තේ වෙන්දේසි ඉඩම; බටහිරට: මාර්ගය.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ
යොමු අංකය: 4/3/15/2012/VE/59.
ප්‍රා. ලේකම්ගේ යොමු අංකය : PTB/LND/ACQVI/7/26.
2013 මැයි මස 29 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

06 - 369

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, ඉබ්බාගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඉහල විසිදෙකේ කෝරළේ සුළු කොට්ඨාසයේ පරණගම්පිටිය ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක කු/අයිබීබී/2006/405 හා 2006.10.30 දිනැති ප්‍රගමන අනුරේඛනයේ දැක්වෙන පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුක්ත ඉඩම් කැබැල්ලට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – පරණගම්පිටිය වත්ත – ප්‍රමාණය: හෙක්. 1.106 ක් පමණ**

උතුරට: මෙම ඉඩමේ ඉතිරි කොටස සහ ඇළ; නැගෙනහිරට: මෙම ඉඩමේ ඉතිරි කොටස; දකුණට: දැදුරු ඔය; බටහිරට: මෙම ඉඩමේ ඉතිරි කොටස.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

මගේ අංකය: LD/05/2006/WS/267.
2013 අප්‍රේල් මස 22 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

06 - 370

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, ඇලපාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, නවදුන් කෝරළේ පල්ලෙපත්තුව සුළු කොට්ඨාසයේ ගඟුල්විටිය (අ.ග.පි. 83) ගමේ පිහිටි ජ්‍යෙෂ්ඨ මැනුම් අධිකාරී විසින් පිළියෙල කරන ලද අංක ආර්/ඊඑල්පී/2012/447 හා 2012.10.14 දිනැති ප්‍රගමන අනුරේඛනයේ කැබලි අක්ෂර ඒ වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 9.3560 ක් පමණ වූ පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම් කොටස:

01. **කැබලි අක්ෂර 'ඒ' – රඹුක්කන්දවත්ත, ගඟුල්විටියවත්ත, දවටගහදෙනියහේන ඉඩම – ප්‍රමාණය: හෙක්. 9.3560 ක් පමණ**

උතුරට: කැබලි අංක 75, 19ඊ, 74, 56, 19 සහ 73; නැගෙනහිරට: කැබලි අංක 73, 19 සහ ගඟුල්විටිය දොළ; දකුණට: ගඟුල්විටිය දොළ, කැබලි අංක 19, 73 සහ 50; බටහිරට: කැබලි අංක 50, 75, 19ඊ, 74, 56 සහ 19.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

යොමු අංකය: 4/3/15/2012/VE/173.
2013 අප්‍රේල් මස 08 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

06 - 371

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.